සබරගමුව විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සංග්‍රහය
පස්වැනි කලාපය, ද්විතීය භාගය, 2010 ජනවාරි , 207-224
ISSN 1800-1459

# දෘශ්‍යාත්මක මානව විද්‍යාව හා මානවවංශලේඛ චිත්‍රපට

**සුමින්ද කේ. ගුණරත්න**

*ශ්‍රව්‍ය දෘශ්‍ය ඒකකය, ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය, තැ. පෙ. 02, බෙලිහුල්ඔය.*

**සාරාංශය**

ශ්‍රී ලාංකේය මානව විද්‍යා ක්ෂේත්‍රයේ දෘශ්‍යාත්මක මානව විද්‍යා (Visual Anthropology) සංකල්ප තහවුරු කිරීම, මෙතෙක් හඳුනාගෙන නොමැති ලාංකේය මානවවංශලේඛ චිත්‍රපට (Ethnographic Film) සම්ප්‍රදායක් පිළිබඳ අවධානය යොමු කරවන්නකි. එය මානව විද්‍යාත්මක දැනුම ගවේෂණයේ හා සමාජගත කිරීමේ නව විධික්‍රමයක් හඳුන්වා දීමක් මෙන් ම ග්‍රන්ථානුසාරී දැනුම් නිෂ්පාදන ක්ෂේත්‍රයේ වත්මන් සීමා හා ගැටළු අභිබවනයට ද හේතු වන්නකි. වාර්තා චිත්‍රපටයත් සමඟ බිහි වූ මානවවංශලේඛ චිත්‍රපටය, ජගත් සිනමාරම්භයේ සිට වැදගත් මානව විද්‍යාත්මක කාර්යභාරයක් ඉටු කර ඇත. එහෙත් ශ්‍රී ලාංකේය සිනමාවෙන් එයට දායකත්වයක් සපයා නොමැති බව ජගත් මානවවංශලේඛ චිත්‍රපට නාමාවලි පිරික්සීමේ දී තහවුරු වේ. එබැවින් ශ්‍රී ලාංකේය මානවවංශලේඛ චිත්‍රපට සම්ප්‍රදායක් සඳහා සංකථනයක් සම්පාදනය මෙම පර්යේෂණ පත්‍රිකාවේ අධ්‍යාශය යි. එය එබන්දක් සඳහා දරන ප්‍රථම වෑයම ද විය හැකි ය. සිනමාව මානවවංශ ලේඛන (Ethnography) මාධ්‍යයක් ලෙස අඩ සියවසකට වැඩි කාලයක් ජගත් මානව විද්‍යාඥයන්ගේ ඇගයීමට ලක් ව තිබීම අපගේ මේ වෑයම තවත් දිරි ගන්වන්නකි.

**කේන්ද්‍රීය වචන:** දෘශ්‍යාත්මක මානව විද්‍යාව, මානවවංශලේඛ චිත්‍රපටය,රොබර්ට් ෆ්ලැහර්ටි, වාර්තා චිත්‍රපටය, මානවවංශ ලේඛනකරණය

## හැඳින්වීම

නූතන ශ්‍රී ලාංකේය මානව විද්‍යා සම්ප්‍රදායක් බිහි කර ගැනීමට පර්යේෂණ දැනුම සමාජගත කිරීමේ දී නවීන තාක්‍ෂණික පහසුකම් භාවිතය අත්‍යවශ්‍ය සාධකයකි. පර්යේෂණාත්මක ශාස්ත්‍රීය දැනුම නිෂ්පාදනය සඳහා මෙරට ග්‍රන්ථ ප්‍රකාශන කර්මාන්තයෙන් ලැබෙන සානුබලය ප්‍රමාණවත් නොවේ.(පෙරේරා, 2008-12-28). ඒ නිසා ම පර්යේෂණ දැනුම සමාජගත කිරීම සඳහා නව විධික්‍රම කරා එළඹීම කාලීන අවශ්‍යතාවකි. ඒ සඳහා මෙතෙක් මෙරට භාවිත වූ ජනප්‍රිය විධික්‍රමයක් වූයේ නවකතාවක ආකාරයෙන් මානව විද්‍යා දැනුම ඉදිරිපත් කිරීම යි. එහෙත් මානව විද්‍යා දැනුම සාහිත්‍ය ප්‍රකාරයෙන් ඉදිරිපත් කිරීමට වඩා වැඩි ආකර්ෂණීය හා යථාරූපී භාවයක් (realistic) සිනමාත්මක ඉදිරිපත් කිරීමක් මගින් සිදුවන බැව් නූතන මානව විද්‍යා ක්ෂෙත්‍රයේ පිළිගැනීම යි (Crowford and Turton, 1992; Gundi, 2004; Ruby, 1996). ඒ සඳහා අවශ්‍ය ශික්ෂණ ක්‍රමය සම්පාදනය සඳහා දෘශ්‍යාත්මක මානව විද්‍යාව (Visual Anthropology) යනුවෙන් නව විෂය ධාරාවක් ජගත් පරිමාණයෙන් වර්ධනය වී ඇත. ඒ අනුව දෘශ්‍යාත්මක ඉදිරිපත් කිරීම් හා අන්වේෂණයන්ගෙන් තොර ව මානවවංශ ලේඛනකරණය (Ethnography) නිසි පරිදි කළ නොහැකි ය යන මතය වඩ වඩාත් තහවුරු වෙමින් පවතී. New Terrain ; No Visual, No Anthropology' යනුවෙන් ෆැඩ්වා එල්. ගුන්දි (Fadwa L. Gundi) පවසන්නේ එබැවිනි (Gundi, 2004: 10). මානව වංශ ලේඛනකරණයේ දී දෘශ්‍යාත්මක මාධ්‍යයක් ලෙස සිනමාව සතු අසම හැකියාව මාග්‍රට් මීඩ් (Margaret Mead) පෝල් හෝකින්ස් (Paul Hockings) ජීන් රොච් (Gean

Rouch) ද අවධාරණය කරති (Hockings, 1975: 3-38). සිනමාව මානව විද්‍යානුකූල යථාර්ථාන්වේෂණයේ සංකථනයක් ලෙස (Film as Discourses; The Invention of Anthropological Realiti) භාවිත කළ හැකි බව පීටර් ඉයන් ක්‍රුවුෆොඩ් (Peter Ian Crawford) පෙන්වා දෙයි (Crawford, 1992 : 66-79). ඒ හෙයින් ශ්‍රී ලාංකේය මානව විද්‍යා ක්ෂේත්‍රයේ දෘශ්‍යාත්මක මානව විද්‍යා සංකල්ප ස්ථාපිත කිරීම සහ මානවවංශලේඛ චිත්‍රපට සම්ප්‍රදායක් තහවුරු කිරීම කාලෝචිත හා අත්‍යවශ්‍යය පර්යේෂණ ක්ෂේත්‍රයකි.

## දෘශ්‍යාත්මක මානව විද්‍යාව

Visual Anthropology නමින් ප්‍රචළිත දෘශ්‍යාත්මක මානව විද්‍යාවට අදාළ විෂයානුකූල ප්‍රවණතා විසිවන සියවසේ මුල් භාගයේ දී නව මාධ්‍යයයේ දියුණුවත් සමඟ තහවුරු වේ. ඡායාරූපය, සිනමාකරණය, විඩියෝ තාක්ෂණය ඊට බලපෑ හේතු සාධක යි. දෘශ්‍යාත්මක මානව විද්‍යාව; සංස්කෘතික මානව විද්‍යාවේ උපවිෂය ක්ෂේත්‍රයක් ලෙස ද සැලකේ. සංස්කෘතික අධ්‍යයනයෙහි දී දත්ත වාර්තාකරණය හා සම්පාදනයට මෙන් ම මානවවංශ ලේඛනකරණය සඳහා ඡායාරූපය, සිනමාව හා විඩියෝ තාක්ෂණය භාවිත කිරීම උගන්වන ශික්ෂණ ක්‍රමයක් ලෙස ද මෙම විෂය හැඳින්විය හැකි ය. Visual Anthropology යන්න Ethnology, Ethnogrphic යන්නට පර්යාය ව යෙදෙන අවස්ථා ද දක්නට ලැබේ (Visul Anthropology, 2009). විවිධ අධ්‍යයන සම්ප්‍රදායන් අනුව විවිධ රටවල බහුවිධ අර්ථයකින් භාවිත කළ ද Visual Anthropology යනු කිසියම් ජන සමාජයක සංස්කෘතික ලක්ෂණ දෘශ්‍යාත්මක නිරූපණය වීම් ඔස්සේ හදාරන විෂය ක්ෂේත්‍රය යි. මෙහි දී ගුහා චිත්‍ර, කැටයම්, මැටිබඳුන් චිත්‍ර, ආයුධවල හැඩ තල, චර්ම චිත්‍ර, රේඛා හා වර්ණ පිළිබඳ ව අවධානය යොමු වේ. එමෙන් ම ඇස්, අත්, පා, හිස්, කොන්ඩා ආදී මූලික මිනිස් හැඩතලයන් ද අදාළ වේ. එවැනි දෑ අඩංගු චිත්‍ර, චිත්‍රපට, උපකරණ, ඡායාරූප, විඩියෝ පට අධ්‍යයනය කිරීමට අනුබල දෙන්නේ දෘශ්‍යාත්මක මානව විද්‍යාව යි. මිනිසා පිළිබඳ ව පරිපූර්ණ ව හැදෑරීම සඳහා නව තාක්ෂණික ප්‍රවණතා ආශ්‍රයෙන් මානව විද්‍යානුකූල ව වර්ධනය කර ගත් විෂය ක්ෂේත්‍රයක් ලෙස ද මෙය හැඳින්විය හැකි ය.

1984 දී ස්ථාපිත දෘශ්‍යාත්මක මානව විද්‍යා සංගමයේ (Society of Visual Anthropology - SVA) නිල ප්‍රකාශනයට අනුව දෘශ්‍යාත්මක මානව විද්‍යාව නිර්වචනය වන්නේ මෙපරිද්දෙනි.

The use of images for the description, Analysis, communication and Interpretation of human (and some time non human) behavior kinesics, proxemics and related Forms of body motion communication (ex. gesture, emotion, dance, sing language) as well as visual aspects of culture, Including architecture and material artifacts. It also includes the use of image and auditory media, Including still photography, film, video and noncamara generated Images, in the recording of Ethnographic, archeological and other Anthropological genres, how aspects of culture can be pictorially a Source of ethnographic data, expanding our horizons beyond the reach of memory culture. It is the study of how Indigenous, professioual; and amateur forms of pictorial and Ideological contexts (Gundi, 2004: 16).

'මාධ්‍ය රූප භාවිතයෙන් විස්තාරිත, විමර්ශිත, සංනිවේදිත හා අර්ථ නිරූපිත මානව හා මානව නොවන චර්යා හුරු පුරුදු හා බැඳුණු සංනිවේදනාත්මක ශාරීරික හැසිරීම් (උදා: ඉංගීතයන්, භාවාත්මකවීම්, නැටුම්, සංකේත භාෂණයන්) මෙන් ම සංස්කෘතිය හා මනා ව සබැඳුණු ගෘහ නිර්මාණ හා ද්‍රව්‍යමය නිර්මාණ පිළිබඳ ව දෘශ්‍යාත්මක ඉදිරිපත් කිරීම් මෙහි විෂය පථයට අයත් වේ. ඡායාරූපය, සිනමාව, වීඩියෝ මෙන් ම කැමරා තාක්ෂණික නොවන මාධ්‍යයෙන් ලබා ගත් රූප, මානවවංශ ලේඛනකරණයට ලක් වූ ඉදිරිපත් කිරීම්, පුරාවිද්‍යාව ඇතුළු සෙසු මානව විද්‍යාවන්ට අදාළ විෂය ක්ෂේත්‍රයන්ට මූලාශ්‍රයන් සපයා ගත හැකි ය. මානව සංස්කෘතිය පිළිබඳ අපගේ දැනුම් පරිධිය පුළුල් කරන සියලු දෑ ද මීට අදාළ වේ'.

ඇතැම් විද්වත් මතයකට අනුව මෙම විෂය සංස්කෘතික මානව විද්‍යාවේ උපවිෂය ක්ෂේත්‍රයක් ලෙස නම් කිරීම සදොස් ය. ඔවුන්ට අනුව දෘශ්‍යාත්මක මානව විද්‍යාව මානව; විද්‍යාවේ ප්‍රධාන විෂය ක්ෂේත්‍ර වූ වාග් විද්‍යාව, පුරාවිද්‍යාව, ජීව විද්‍යාව හා සංස්කෘතික මානව විද්‍යාවට සම්බන්ධ අනුපූරක විෂයක් වේ. මේ ක්ෂේත්‍ර හතරට ම දෘශ්‍යාත්මක මානව විද්‍යාවේ ප්‍රභාව විහිදේ. එය පර්යේෂණ ඉදිරිපත් කිරීමට පමණක් නොව ඇතැම් පර්යේෂණ කිරීමට ද ඉවහල් වන්නකි. දෘශ්‍යාත්මක මානව විද්‍යාව වර්තමානයේ දී අංකිත (Digital) මාධ්‍ය තාක්ෂණයත් සමඟ නව පරාසයකට විහිදී ගොස් ඇත. මේ පිළිබඳ ව අදහස් දක්වන මිචෙල් ඩී. පිශ්චර් (Michael D. Fischer) සහ ඩේවිඩ් සෙයිට්ලින් (David Zeitlyn) පෙන්වා දෙන්නේ බහුවිධ මාධ්‍ය (Multimedia) ඔඩොක්කු පරිගණකය, (Laptop) ආශ්‍රය කරගනිමින් දෘශ්‍යාත්මක මානව විද්‍යාව නව විෂය පරාසයකට ගමන් කරන බව ය. 'දෘශ්‍යාත්මක මානව විද්‍යාව ඩිජිටල් කැඩපත මත, පරිගණක සහායක දෘශ්‍යාත්මක මානව විද්‍යාව' යන මැයෙන් නවතම පර්යේෂණ පත්‍රිකාවක් එළි දක්වන පිශ්චර් සහ සේයිට්ලින් මෙම නව ප්‍රවණතා කෙරෙහි දැඩි අවධානයක් යොමුකර තිබේ. විශේෂයෙන් ම ක්ෂේත්‍ර පර්යේෂණවල නිරතවන මානව විද්‍යාඥයන් මේ වන විට දත්ත රැස්කිරීම, වර්ගීකරණය, සංස්ලේෂණය, විශ්ලේෂණය වැනි කාර්යයන්ට පරිගණකය යොදා ගැනීමත් මෙම දත්ත මත පදනම් ව මෘදුකාංග, සැකසීමත්, එමගින් ත්‍රිමාණ සජීවිකරණ ලබා ගැනීමේ හැකියාවත් පිළිබඳ ව විමර්ශනයට ලක්වී ඇත (Fischer and Zeitlyn, 2003).

## මානවවංශලේඛ චිත්‍රපට

මානවවංශලේඛ චිත්‍රපට පිළිබඳ ව Ethnographic Film නමින් ප්‍රශස්ත ග්‍රන්ථයක් සම්පාදිත කාර්ල් ජී හයිඩර්ට (Karl G Heider) අනුව මානවවංශලේඛ චිත්‍රපටය නිර්වචනයක් (definition) අපේක්ෂා නො කරයි. එහෙත් එහි සීමා මායිම් හා බෙදුම් රේඛා හඳුනා ගැනීම අසීරු නොවේ. එමෙන් ම එහි විශේෂාංග ද අවධාරණය කර ගත හැකි ය. ඒ සඳහා ඔහු පහත සඳහන් ප්‍රශ්නාර්ථ නගයි.

1. උසස් ප්‍රමිතියක සිනමා ප්‍රවේශයක් ඔස්සේ මානවවංශ ලේඛනකරණ අරමුණු සපුරා ගත හැකි ද?

2. ලිඛිත මාධ්‍යයට වඩා වැඩි දත්ත සම්පාදනයක් චිත්‍රපටය මගින් සිදු කළ හැකි ද?

'A single picture is worth ten thousnd word, A single word can be worth ten thousand picture's යනුවෙන් පවසන හයිඩර්ට අනුව එක් රූපයක් වචන දස දහසකට වඩා වටිනවාක් මෙන් ම එක් වචනයක් රූප දස දහසකට වඩා වටිනාකමක් ගැනීමට ද ඉඩ ඇත. ඒ අනුව චිත්‍රපටය යනු මානවවංශ ලේඛනකරණය සඳහා භාවිත කළ හැකි උපකරණයක් බව පැහැදිලි වේ. එය ඇතැම් විටක ලිඛිත භාෂාවට වඩා ප්‍රබල වේ. කලාව හා විද්‍යාව අතර ඒකමිතියක් ඇතිකර ගැනීමේ වෑයමක් ලෙස ද මානවවංශලේඛ චිත්‍රපටය හඳුන්වාදීමට හයිඩර් ඉදිරිපත් වේ. මානවවංශ ලේඛනකරණය යන්න පිළිබඳ ව විවිධ නිර්වචන ඉදිරිපත් ව ඇත. හයිඩර්ට අනුව මානවවංශ ලේඛනකරණය යනු කිසියම් අවධාරිත සමාජ කණ්ඩායමක චර්යා රටා පිළිබඳ ව දීර්ඝකාලීන නිරීක්ෂණ හා අධ්‍යයන ආශ්‍රිත ව ලබා ගත් දත්ත විශ්ලේෂණය හා සංශ්ලේෂණය කිරීමෙන් නව දැනුමක් සම්පාදනය කරන මාර්ගයකි (Hider, 1976: 6) මානවවංශ ලේඛනකරණයේ දී අනුගමනය කරන පියවර හා මානවවංශ චිත්‍රපටකරණයේ දී අනුගමනය කරන පියවර අතර සංසන්දනාත්මක විග්‍රහයක් ඔහු ඉදිරිපත් කරයි (රූපසටහන 1). ඒ අනුව පැහැදිලි වන්නේ චිත්‍රපටයක දී මෙන් ම ලිඛිත පර්යේෂණයක දී ද ක්‍රමවේදය සමාන වන බව යි (Hider, 1976: 6).

| | |
|---|---|
| මානවවංශ ලේඛනකරු<br>The ethnographer | චිත්‍රපටකරු<br>The filmmaker |
| ⇓ | ⇓ |
| න්‍යායාත්මක ගැටළුව හඳුනා ගැනීම හා පර්යේෂණය සැලසුම් කිරීම<br>Begins with theoretical problems and Research Plans | සංකල්පමය හා තිරරචනාමය කාර්ය ඇරඹීම<br>Begins with an idea and a script |
| ⇓ | ⇓ |
| නිරීක්ෂණ සහ සම්මුඛ සාකච්ඡා මගින් දත්ත ඒකරාශීකරණය<br>Gathers data making observations and asking Question | රූගත කිරීමේ පියවර<br>Shoots footage |
| ⇓ | ⇓ |
| දත්ත විශ්ලේෂණය<br>Analyzes data | සංස්කරණ පියවර<br>Edit footage |
| ⇓ | ⇓ |
| ලේඛන හා වාර්තා සම්පාදනය<br>Write and rewrite and produce written report | චිත්‍රපට නිෂ්පාදනය<br>Produces a film (Hider, 19769) |

රූපසටහන 1: මානවවංශ ලේඛනකරණයේ හා චිත්‍රපටකරණයේ පියවර

චිත්‍රපටයක් රූපගත කිරීමේ දි ලබා ගත් දර්ශන කිසිදු වෙනස් කිරීමකට පසුව ඉඩකඩ නොලැබේ. උපශීර්ෂ හා හඬකැවීම් සහ සංගීත සංයෝජන ආදියෙන් පමණක් යම් වෙනසක් සිදු කිරීමට චිත්‍රපටකරුට ඉඩ කඩ ඇත. එහෙත් මානවවංශලේඛ චිත්‍රපටකරුවෙකුගේ දත්ත වශයෙන් සැලකෙන්නේ ඔහු ලබා ගන්නා රූප යි. ඒවා ඉතා පරෙස්සමින් සහ සැලකිල්ලෙන් පරිහරණය කිරීම අධ්‍යක්ෂවරයකුගේ වගකීම වේ. වෙනස්කම් සිදු කළ ද ඉන් රූපමය ප්‍රකාශය ඉක්මවා යාමක් අපේක්ෂා කළ නො හැකි ය. එනම් දත්ත විකෘත කිරීමක් සිදු කළ නො හැකි ය. එය යථාර්ථයට වඩාත් සමීප ව දත්ත ඒකරාශීකරණය කිරීමට මෙන් ම සම්පාදනයට ද ඉවහල් වේ. ලිඛිත වාර්තා සම්පාදනයේ දී ලබා ගත් දත්ත වචන මගින් ඉදිරිපත් කෙරේ. වචන සංවිධානයෙන් වාක්‍ය ද වාක්‍ය සංවිධානයෙන් ඡේද ද ඡේද සංවිධානයෙන් පරිච්ඡේද ද සම්පාදනය කෙරේ. ඒ සමස්තය වාර්තාවක් ලෙස සැකසේ. වාර්තාව සකස් කිරීමේ දී පර්යේෂකයාගේ අරමුණු, හැඟීම් සහ යථාර්ථය අතර සංකුලතාවක් සිදුවේ. මෙම අදියර චිත්‍රපටයේ දී සිදු වන්නේ සංස්කරණයේ දී ය. මේ අනුව අපට පැහැදිලි වන්නේ මානවවංශලේඛ චිත්‍රපටයක් නිපදවීම ද මානව වංශ ලිඛිත පර්යේෂණයක් සිදු කිරීම ද අතර ක්‍රමවේදී ව වෙනසක් නොමැති බව යි. වෙනස ඇත්තේ ඒ සඳහා භාවිත භාෂාත්මක මෙවලම මත යි. ඒ අතරින් චිත්‍රපටය වැඩි පිරිසකට භාෂා බාධකය බිඳ සමීප විය හැකි චිත්තාකර්ෂණීය රූප මාධ්‍යයක් බව අප අමතක නොකළ යුතු ය.

මානවවංශ ලේඛනකරණය සඳහා භාවිත කළ හැකි විශිෂ්ට උපකරණයක් ලෙස චිත්‍රපටය සමාරම්භක යුගයේ දී ම විද්වතුන්ගේ නොමඳ අවධානයට ලක් විය. චිත්‍රපටය භාවිතයෙන් මානවවංශ පර්යේෂණ සිදු කිරීම සඳහා අවශ්‍ය න්‍යායාත්මක අවබෝධය දෘශ්‍යාත්මක මානව විද්‍යාවෙන් ලබා දෙයි. 1990 දී, රාජකීය මානව විද්‍යා ආයතනයේ දෙවන ජාත්‍යන්තර මානවවංශලේඛ චිත්‍රපට උළෙලට සමගාමී ව පැවති විද්වත් සම්මන්ත්‍රණයේ තේමාව වූයේ 'චිත්‍රපටය මානවවංශ ලේඛනයක්' ලෙස (film as ethnography) යන්න ය. මැන්චෙස්ටර් විශ්වවිද්‍යාලයේ පැවති මෙම විද්වත් සමුළුවේ දී ඉදිරිපත් වූ අදහස් මගින් තහවුරු වූයේ මානවවංශ ලේඛනකරණයේ දී චිත්‍රපටය සතු ශක්‍යතාව යි. එම අදහස් සංගෘහිත කෘතියක් සංස්කරණය කරන පීටර් ඉයන් ක්‍රවුෆෝඩ් (Peter Ian Crawford) සහ ඩේවිඩ් ටර්ටන් (David Turton) එහි පූර්විකාවේ මෙබඳු සඳහනක් තබති. අපගේ වෑයම වූයේ මානවවංශ විද්‍යාඥයන් මෙන් ම චිත්‍රපටකරුවන්ට ද මානවවංශ ලේඛනකරණය හා චිත්‍රපටය අතර ඇති සබඳතාව ඔස්සේ ලිඛිත භාෂාවේ වචනත් මානවවංශ ලේඛනකරණයේ වියමනත් (text) පිළිබඳ ව අලුතින් සිතන්නට පෙළඹවීම යි (Crawford, 1992 : 1).

චිත්‍රපටය; වෘත්තාන්තමය (fiction) හා වෘත්තාන්තමය නොවන (non fiction) යනුවෙන් මූලික ප්‍රකාර දෙකක් ඔස්සේ ජගත් සිනමාවේදීහු විමසති (වෙල්ස්, 2004) එහි දී වෘත්තාන්ත නොවන චිත්‍රපටය යටතේ සිනමා ස්වරූප ගණනාවක් දක්වා ඇත. සාකච්ඡා කිරීමේ පහසුව සඳහා එම ස්වරූප මෙසේ ක්‍රමාංක කෙරේ.

චිත්‍රපට

(Film)

වෘත්තාන්ත චිත්‍රපට

(Fiction Film)

වෘත්තාන්ත නොවන චිත්‍රපට

(Non Fiction Film)

- තොරතුරු චිත්‍රපට (Factual Film)
- මානවවංශලේඛ චිත්‍රපට (Ethnographic Film)
- ගවේෂණාත්මක චිත්‍රපට ( Film of Exploration)
- සෘජු චිත්‍රපට (Direct Film)
- සැබෑ තතු සිනමාව (Cinama Verity Film)
- වාර්තා චිත්‍රපට (Documantary Film)

**රූප සටහන 2: චිත්‍රපට වර්ගීකරණය**

රූප සටහන 2 ට අනුව මානවවංශලේඛ චිත්‍රපටය අයත් වන්නේ වෘත්තාන්ත නොවන චිත්‍රපට ප්‍රකාරයට ය. එහෙත් මෙතෙක් ලොව නිපදවා ඇති මානවවංශලේඛ චිත්‍රපට ස්වරූප සැලකීමේ දී එය වෘත්තාන්ත නොවන චිත්‍රපට ප්‍රකාරයට පමණක් අයත් කොට අධ්‍යයනය කිරීම සාධාරණ නොවේ. මක් නිසාදයත් වෘත්තාන්තමය මානවවංශලේඛ චිත්‍රපට නිර්මාණය වී ඇත්තේ මානවවංශලේඛ චිත්‍රපටයේ සම්භව අවස්ථාවේ දී ම වන හෙයිනි. රොබට් ජේ. ෆ්ලෙහාටි (Robert J. Flaharty) නිර්මාණය කරන ලද නැනුක් ඔෆ් ද නෝත් (Nanook of the North 1922) චිත්‍රපටය මෝනා (Mona, 1926) චිත්‍රපටය මෙහි දී සනිදර්ශන ලෙස සඳහන් කළ හැකි ය. මෝනා චිත්‍රපටය වාර්තාමය හා වෘත්තාන්තමය ලක්ෂණ මුසු කරමින් නිර්මාණය කළ චිත්‍රපටයකි. මේ ගණයේ චිත්‍රපට වාර්තාවෘත්තාන්ත චිත්‍රපට (docufiction film) යනුවෙන් ද හැඳින්වේ. නැනුක් ඔෆ් ද නෝත් උසස් සිනමා නිර්මාණයක් ලෙස විචාරක අවධානය නොමඳ ව දිනා ගත් වාර්තාවෘත්තාන්ත චිත්‍රපටයකි (Branouw, 1993 :27). මේ අනුව මානවවංශලේඛ චිත්‍රපට හඳුනා ගැනීමේ දී;

1. මානවවංශලේඛ වෘත්තාන්ත චිත්‍රපට (ethnographic fiction film)

2. මානවවංශලේඛ වෘත්තාන්ත නොවන චිත්‍රපට (ethnographic non fiction film)

වශයෙන් සැලකීම වඩාත් ම යෝග්‍ය වේ. පූර්වෝක්ත ප්‍රභේදනයට අනුව රොබට් ෆ්ලෙහාටි විසින් නිපදවූ චිත්‍රපට දෙක ම අයත් වන්නේ මානවවංශලේඛ වෘත්තාන්ත චිත්‍රපට ධාරාවට ය. මානවවංශලේඛ චිත්‍රපටය තවත් ප්‍රකාර දෙකක් ඔස්සේ අධ්‍යයනය කළ හැකි ය.

1. මානවවංශ ලේඛනකරණය සඳහා චිත්‍රපට මාධ්‍ය භාවිත කරමින් මානව විද්‍යාඥයන් විසින් නිපදවන ලද චිත්‍රපට.

2. සංස්කෘතික අධ්‍යයනය සඳහා පාදක කර ගත හැකි එහෙත් මානව විද්‍යාඥයන් නොවන පුද්ගලයන් විසින් නිපදවන ලද මානවවංශ ලේඛනයක් සිදුවී ඇති චිත්‍රපට.

මෙහි ප්‍රථම ප්‍රකාරයට අයත් චිත්‍රපට නිපදවීමට අවශ්‍ය ශික්ෂණය මානව විද්‍යාඥයන්ට ලබා දෙන්නේ දෘශ්‍යාත්මක මානව විද්‍යාව මගිනි. මානවවංශ ක්ෂේත්‍ර පර්යේෂණයක ඍජු ප්‍රතිඵලයක් වශයෙන් මානවවංශ ලේඛනයක් ලෙස නිර්මාණය වන චිත්‍රපට මෙහි දී සැලකිල්ලට ගැනේ. මේ සඳහා සිනමා මාධ්‍ය දැනුම මෙන් ම මානව විද්‍යා දැනුම ද අනිවාර්ය සාධකයකි. මානව වෘත්තාන්ත චිත්‍රපටයේ (ethnofiction film) ප්‍රණේතෘවරයා (progenitor) ලෙස සැලකෙන ජීන් රොච් (Jean Rouch) එවැන්නෙකි (ethnofiction, 2009) . ඔහු මෙම ක්ෂේත්‍රයට පිවිසෙන විට ජගත් සිනමාවේ මානවවංශලේඛ චිත්‍රපට බිහි ව තිබුණේ දහයකට අඩු ගණනකි (List of VAF , 2009). මානව විද්‍යාඥයකු වූ ජීන් රොච් සිය පුරෝගාමී කටයුත්ත මනා ව සිදු කළේ ය. මේ අනුව 1957 දී ඔහු නිපද වූ "ද මැඩ් මාස්ටර්" (The Mad Master) නම් ලොව ප්‍රථම මානව වෘත්තාන්ත චිත්‍රපටය මානව විද්‍යාඥයන්ගේ මෙන් ම සිනමා විචාරකයන්ගේ ද පැසසුමට ලක්විය (Ethnofiction, 2009). මානව වෘත්තාන්ත චිත්‍රපට මානවවංශලේඛ වෘත්තාන්ත චිත්‍රපට ශානරයේ උපශානරයක් ලෙස හැඳින්විය හැකි ය. ජීන් රොච් එහි පීතෘවරයා වන අතර රොබට් ප්ලෙහාටි එහි සීයා වශයෙන් හැඳින්වේ. ජීන් රොච්ට පෙර මානව විද්‍යාඥයන් විසින් කැමරාව භාවිත කරන ලද්දේ නිරීක්ෂණ වාර්තා කර ගැනීමේ උපකරණයක් ලෙස පමණි. නිරීක්ෂණය හා නිරීක්ෂිතය අතර සුවිශේෂී කාර්යභාරයක් කැමරාවට නො පැවරිණි. එහෙත් මානව වෘත්තාන්ත චිත්‍රපට ශානරය එම සම්ප්‍රදායික සංකල්පය බිඳ දැමීම සමත් විය. කැමරාව සහ ඒ පසු පස සිටින මානව විද්‍යාඥයාට ඒ අනුව සුවිශේෂී කාර්යයක් පැවරේ. ඒ අධ්‍යක්ෂවරයාගේ කාර්යය යි. "නළුවා පර්යේෂණ මෙවලමකි" යන අදහස තහවුරු කිරීමට මේ අනුව ජීන් රොච්ට හැකි විය. නිරීක්ෂිතයෙන් ම නළුවන් තෝරා ගැනීම චිත්‍රපටය වඩාත් මානව විද්‍යානුරූපී කෘතියක් වීමට ඉවහල් විය.

ඉහත සඳහන් දෙවෙනි වර්ගයට අයත් චිත්‍රපට හොලිවුඩ්, බොලිවුඩ් වැනි ජගත් පරිමාණ මහා සිනමා ප්‍රවාහයෙන් බිහිවේ. ඇතැම් ටෙලි මාලා නාටක ද මීට අයත් වෙයි. මානවවංශ ලේඛනකරණය සිදු ව ඇති හෝ ඊට දත්ත සපයා ගත හැකි චිත්‍රපට මානව විද්‍යාඥයන් නොවන අධ්‍යක්ෂවරුන් අතින් ද බිහිවන බව මේ අනුව පැහැදිලි වෙයි. රොබට් ජේ. ෆ්ලෙහාටි ඊට කදිම නිදසුනකි. එබැවින් එවැනි චිත්‍රපට නිපදවීම ධෛර්යවත් කරන එම චිත්‍රපට හදාරන විෂය ක්ෂේත්‍රය දෘශ්‍යාත්මක මානව විද්‍යාව යි.

ජගත් සිනමා ක්ෂේත්‍රයේ පුරෝගාමී මානවවංශලේඛ චිත්‍රපටකරු ලෙස සැලකෙන්නේ රොබට් ෆ්ලෙහාටිය. ඔහු විසින් නිපදවූ නැනුක් ඔෆ් ද නෝර්ත් චිත්‍රපටය මානව විද්‍යාව හදාරා නැති පුද්ගලයකු නිපද වූ මානවවංශලේඛ චිත්‍රපටයක් ලෙස සැලකේ. මෙම

චිත්‍රපටය හඩ්සන් බොක්ක ආශ්‍රිත ප්‍රදේශයේ රූගත කෙරුණු අතර ඉන් නිරූපිත වූයේ ඉනුවිට් ගෝත්‍රික ඇස්කිමෝවරුන්ගේ සංස්කෘතිය යි. චිත්‍රපටිය සම්බන්ධයෙන් ෆ්ලේහාටිට ප්‍රශංසා මෙන් ම ප්‍රබල විවේචන ද එල්ල විය. ඉනුවිට් ගෝත්‍රිකයන්ගේ කාලඅවකාශ යථාර්ථය (time space reality) මනා ව නිරූපණය නොවන බව ඔහුට එල්ල වූ ප්‍රධාන චෝදනාව යි. චිත්‍රපටය රූගත කරන වකවානුවේ දී ඉනුවිට් ගෝත්‍රිකයන් ලෝකයේ ආර්ථික හා තාක්ෂණික වෙනස්කම් අනුව සංස්කෘතික විපර්යාසයන්ට මුහුණපා සිටියේ ය. එහෙත් එම තත්වය චිත්‍රපටය තුළ නිරූපණය නොවීම විචාරක අවධානයට ලක් විය. ඔවුන් චෝදනා කරන්නේ ෆ්ලෙහාටි ඉනුවිට් ගෝත්‍රික ජීවිතයේ පැරණි ස්වරූපය ප්‍රතිනිර්මාණය කිරීමට අනවශ්‍ය වෑයමක නිරත ව ඇති බව යි. තුවක්කුව භාවිත කරමින් සීල් මත්ස්‍යයන් දඩයම් කරන ගෝත්‍රිකයන්ට හාපුන් (Hapoon) නැමැති සම්ප්‍රදායික දඩයම් උපකරණ භාවිත කරන ලෙස උපදෙස් දීම මෙහි දී එම අදහස තහවුරු කරන්නකි. ඔවුන්ගේ ඉග්ලු නිවාස රූප ගත කිරීමේ දී සිදුවී ඇති අඩුපාඩු, නළුවන් ලෙස යොදා ගන්නා ඉනුවිට් ගෝත්‍රික පවුලේ ඇඳුම් පැළඳුම්, ඔවුන් සමාජ සංස්කෘතියෙන් හුදකලාවූවන් ලෙස නිරූපණය වීම, ෆ්ලෙහාටිට එල්ලවන චෝදනා අතර වේ. එහෙත් මෙම චිත්‍රපටිය නැරඹූ බොහෝ ප්‍රේක්ෂකයෝ ඉනුවිට් ගෝත්‍රිකයන්ගේ යථාර්ථය ඉන් නිරූපණය වන්නේ යැයි දැඩි ලෙස විශ්වාස කළහ. එහෙත් විචාරකයන් පැවසුවේ එය නිර්මිත යථාර්ථයක් (created reality) බව යි. කෙසේ වෙතත් මානවවංශලේඛ චිත්‍රපටයේ පුරෝගාමියා ලෙස ෆ්ලෙහාටිගෙන් සිදු වූ මෙහෙවර ඒ කිසිදු විචාරකයකින් අවප්‍රමාණ නො වෙයි. මානව විද්‍යාව නොදන, මානවවංශ විධික්‍රම නොහදාරා, සිනමාකරුවෙකු ලෙස ප්ලෙහාටි කටයුතු කර ඇති ආකාරය විස්මයජනක ය (Ethnographic Film, 2009). ෆ්ලෙහාටිගෙන් පසුව 1930 දී ග්‍රෙගරි බැට්සන් විසින් ප්‍රථම වරට නිවුගිනියානු ගෝත්‍රික සමාජයක සංකීර්ණ යාතුකර්ම (complex ritual) වාර්තා කිරීම සඳහා චිත්‍රපටයක් නිර්මාණය කළේ ය. 1950 දී ජෝන් මාෂල් (John Marshal) ඇමරිකානු විද්‍යාලය වෙනුවෙන් 'ද හන්ටර්' (The Hunter) නමින් චිත්‍රපටයක් නිපදවිය. 'ද ස්ටෝරි ඔෆ් අ කුන් බුශ්විමෙන්' (The story of a Kung Bushwoman) නමින් ඔහු නිපදවූ මානවවංශලේඛ චිත්‍රපටය ලොව ප්‍රථම මානවවංශ ජීවන වෘත්තාන්ත චිත්‍රපටය යි. නැපෝලියන් සැග්නොන් (Napoleon Chagnon), ටිම් ඈච් (Tim Asca) සුප්‍රකට මානවවංශලේඛ චිත්‍රපටකරුවෝ වෙති. ඔවුන්ගේ ඇක්ස් ෆයිට් (Ax Fight) ද ෆීස්ට් (The Feast) චිත්‍රපට 1960 දශකයේ දී රූගත කෙරුණේ ඇමේසියානු වනාන්තරවල ය. මෙම චිත්‍රපට මගින් යනමාමෝ (Yanmamo) ගෝත්‍රික ජීවිතය හා බැඳුණු සංස්කෘතිය නිරූපණය විය. ඇක්ස් ෆයිට් චිත්‍රපටය ගෝත්‍රිකයන් දෙපිරිසක් අතර ඇතිවන බිහිසුණු සටනක සජීවී දර්ශන ද ඇතුළත් කෙරුණු දුර්ලභ චිත්‍රපටයකි. ඉන් අනතුරුව මානවවංශ චිත්‍රපටකරණයේ නිරතවූවන් අතර රොබට් ගාඩ්නර් (Robert Gardne), කාල් හයිඩර් (Carl Heider) කැපී පෙනේ. ඔවුන් චිත්‍රපටයේ පූර්ව සැලසුම හා සංස්කරණය කෙරෙහි වැඩි අවධානයක් යොමු කළ අධ්‍යක්ෂවරුන් ය. හාඩ්නර් හා හයිඩර් නිපදවූ බහුවිධ දෘෂ්ටිකෝණ (Multi point of view) චිත්‍රපටියක් ලෙස විචාරක ප්‍රසාදයට ලත් ඩෙඩ් බර්ඩ් (Dead Bird) චිත්‍රපටය 1963 දී තිරගත විය (List of AVF, 2009). හැටේ දශකය වන විට ප්‍රංශ මානව විද්‍යාඥයෝ මෙම ක්ෂේත්‍රය කෙරෙහි උනන්දුවෙන් කටයුතු කළහ. මාෂල් ග්‍රියල් (Marcel Griaule), ග්‍රැමින් ඩෙටර්ලන්ඩ් (Germaine Dieterlen), ජීන් රෝච් (Jean Rouch) මානවවංශ

චිත්‍රපටකරණයට විප්ලවීය විධික්‍රම හඳුන්වා දුන්හ. මිලිමීටර් 16 කැමරාවක් සහ සැහැල්ලු පටිගත කිරීමේ යන්ත්‍රයක් භාවිත කරමින්, කැමරාව ක්ෂේත්‍ර අධ්‍යයනයේ දී අත්‍යවශ්‍ය උපාංගයක් ලෙස ඒත්තු ගැන්වූහ. එය දෘශ්‍යාත්මක මානව විද්‍යාවේ විෂය පරාසය තවත් පුළුල් කිරීමකි. ඒ පිළිබඳ ව අවධානය යොමු කළ මාග්‍රට් මීඩ් මානව විද්‍යාඥවරිය ප්‍රකාශ කළේ නිරීක්ෂණ ලේඛනගත කර ගැනීමේ හොඳම විධික්‍රමය රූප ගතකර ගැනීම බව යි. ඒ සඳහා සිනමාව වැනි නව මාධ්‍ය භාවිත නොකර ප්‍රතික්ෂේප කිරීම මානව විද්‍යා ක්ෂේත්‍රයේ කෙරෙන 'සාපරාධී ප්‍රතික්ෂේපයක්' (a criminal neglect) ලෙස ඈ පෙන්වා දුන්නා ය. 'සමස්ත ලෝකයේ සෑම තැනක ම හා සෑම දූපතක ම මෙන් ම ඇතැම් නවීන වාණිජ නගරවල පවා සැඟවුණු මානව නිම්න පවතී. මේවා වෙත ළඟා වී නිරීක්ෂණ වාර්තා කර ගැනීමේ දී පැන්සල හා පොත හැර වෙනත් උපකරණයක් මානව විද්‍යාවට නොමැති දැයි ඇය ප්‍රශ්න කළා ය. (Hockings, 1975 : 4) මාග්‍රට් මීඩ් ට අනුව හරස් සංස්කෘතික අධ්‍යයනයෙ දි (cross cultural study) ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍ය උපයෝගී කරගැනීම සඳහා දැඩි අවධානයක් යොමු කළ යුතු ය. මාග්‍රට් මීඩ් නමින් ජගත් පරිමාණ මානවවංශලේඛ චිත්‍රපට උළෙලක් සංවිධානය කෙරේ. මේ වන විට පෝලන්තය, ඕස්ට්‍රේලියාව, නවසීලන්තය, ජර්මනිය, ප්‍රංශය, පෘතුගාලය වැනි රටවල ද මානවවංශලේඛ චිත්‍රපට උළෙල සංවිධානය වේ. විදේශිය විශ්වවිද්‍යාලයයන් රැසක උපාධි හා උපාධි මට්ටමෙන් දෘශ්‍යාත්මක මානව විද්‍යාව හැදෑරීමට අවස්ථා සලසා තිබේ.

## ශ්‍රී ලාංකේය මානවවංශලේඛ චිත්‍රපට

ශ්‍රී ලාංකේය සිනමා ක්ෂේත්‍රයේ මානවවංශලේඛ චිත්‍රපට ශානරයක් තව ම හඳුනාගෙන නැත. ඒ සඳහා දෘශ්‍යාත්මක මානව විද්‍යා සංකල්ප සිනමා විචාර ක්ෂේත්‍රයේ තහවුරුවීම අතිශයින් ම වැදගත් වේ. එම සංකල්ප අනුව නිරීක්ෂණය කිරීමේ දී ශ්‍රී ලාංකේය සිනමාව හා ටෙලි නාට්‍ය සම්ප්‍රදාය තුළ මානව සංස්කෘතික අධ්‍යයනය සඳහා ඍජු ලෙස දායක කරගත හැකි මානව විද්‍යානුරූපී කෘතීන් හඳුනාගත හැක්කේ කීපයක් පමණි. ඊට හේතු වූ කරුණු අතර මානවවංශ ලේඛනය සඳහා සාහිත්‍යමය මාදිලිය මෙරට බහු ප්‍රචලිත වීම පෙන්වා දිය හැකි ය. චිත්‍රපටය කර්මාන්තයක් මෙන් ම ආර්ථික භාණ්ඩයකි. ඒ අනුව අඩු ලාභදායී, අධ්‍යාපනික වැදගත්කමකින් යුක්ත චිත්‍රපට නිපදවීමට වඩා වෙළඳපොළ ඉලක්ක කර ගත් විනෝදාස්වාදය සපයන චිත්‍රපට නිපදවීම බහුල ව සිදුවීම තවත් හේතුවකි. කෙසේ වුව ද මෙරට පළ වූ මානව විද්‍යානුරූපී නවකතා කීපයක් පදනම් කර ගනිමින් මානවවංශලේඛ චිත්‍රපට සහ ටෙලි නිර්මාණ කීපයක් බිහිවී ඇත (වාර්තා චිත්‍රපට යුගයේ දී ලංකා ගීතය (Song of Ceylon) වැනි චිත්‍රපට ද අධ්‍යයනයට සුදුසු ය). ලෙනාඩ් වුල්ෆ්, ආර්. ඇල්. ස්පිට්ල් ඉංග්‍රීසි බසින් ද පියසේන කහඳගමගේ, දඹානේ ගුණවර්ධන සිංහල බසින් ද ලියා ඇති නවකතා කීපයක් මානවවංශලේඛ වටිනාකමින් යුක්ත ය. ඒ අතරින් ලෙනාඩ් වුල්ෆ් විසින් රචිත (The Village in the Jungal) කෘතිය ''බැද්දේගම'' නමින් සිංහලට පරිවර්තිත ය. ආර්. ඇල්. ස්පිට්ල් රචිත (The Vanished Trials සහ Savege Sanctuary) කෘති 'මැකීගිය දඩමං' සහ 'වනසරණ' නමින් සිංහල බසට නැගී ඇත. මේ අතරින්

'බැද්දේගම' ලෙස්ටර් ජේම්ස් පීරිස්ගේ අධ්‍යක්ෂණයෙන් එනමින් ම සිනමාවට නැඟිණි. එමෙන් ම 'වනසරණ' තිස්ස අබේසේකර විසින් ටෙලිමාලා නාටකයකට මවනු ලැබි ය. පියසේන කහඳගමගේ ලියූ 'වනවදුලේ වසන්තය' ද ටෙලි මාලා නාටකයට නැඟුණු අතර මෙම නිර්මාණ නවකතාවේ නිරූපිත සුවිශේෂී මානව කණ්ඩායමේහි ජීවිතය හා බැඳුණු සංස්කෘතිය නිරූපණය කිරීමට වෑයම් කරයි. එහෙත් එම නිර්මාණයන් හි දුර්වලතා ලෙස විචාරක අවධානයට ලක්වී ඇති බොහෝ කරුණු ද ඉස්මතුව ඇත්තේ එකී සංස්කෘතිය නිසි ලෙස නිරූපණය නොකිරීම සම්බන්ධයෙනි. බැද්දේගම චිත්‍රපටය පිළිබඳ පළකෙරෙන පහත විචාරය මේ අදහස තහවුරු කරයි.

"ලෙනාඩ් වුල්ෆ් සිය කෘතිය තුළ අතිශය තත්වාකාරයෙන් ද, සුවිශද ලෙසින් ද ප්‍රබල වාග් චිත්‍රයකට නගන්නේ ලංකාවේ ඈත පිටිසර වනගත ගමක වැස්සන් තම දිවි ර ක ගැනීම් වස් ස්වභාව ධර්මය සමඟ ගෙන යන අරගලයේ දුක්ඛ වේදනාව යි. මුල් කෘතියේ එන මානුෂික ගුරු අරුත මකා ඒ මත තම හිසින් මැවූ පුහු පුද්ගලවාදී ලුහු අරුතක් පටවන මේ සිනමාකරුවෝ ඒ පුහු අරුත ව්‍යාජ ගැමි පරිසරය නැමැති දුහුල් පටේ ඔතා දොරට වඩති. වනය මැද චිත්‍රපටකරුවන් මාට්ටුකර ඉදිකරන මේ ගමේ දක්නට ලැබෙන්නේ ඊයේ පෙරේදා මැටි ගැසූ පැල්පත් ය. ප්‍රෝටීන් ද, පිෂ්ට ද, මේද ද බහුල ඉහළ මධ්‍යම පංතියක ගෙවල හීල් මෙහෙවනේ වැඩුණු පුද්ගලයින් සිහිගන්වන ආරෝහ පරිණාහ සම්පත්තියෙන් ද, ඡවි වර්ණයෙන් ද උපේත වූ සුකුමාල ස්ත්‍රී පුරුෂයෝ නැමැති රූකඩයෝ මේ බොරු ගමේ නටවනු ලැබෙති. මෙහි ගැමි ලියන්ගේ ඇස් බැම පෙරන් ගා ඇත" (ගම්ලත්, 1995:55).

මේ විවේචනයෙන් විශද වන්නා වූ මූලික නිගමනය නම් මානවවංශලේඛ නව කතාවකන මානවවංශලේඛ චිත්‍රපටයක් සෑදීමේ දී අදාළ ජන සමූහයේ සංස්කෘතික යථාර්ථය ග්‍රහණය කරගැනීමට චිත්‍රපටකරු අසමත් වූ බවකි. ඒ සඳහා මානවවංශලේඛ චිත්‍රපට පිළිබඳ අවබෝධය වැදගත් වේ. එහෙත් මේ චිත්‍රපටිකරුගේ අරමුණ විනෝදාස්වාදය සහ ජීවිත දැනුම ලබා දෙන වෘත්තාන්තයක් බිහි කිරීම විනා මානව විද්‍යාත්මක වටිනාකමින් යුත් මානවවංශලේඛ චිත්‍රපටයක් නිපදවීම නොවේ. මානවවංශලේඛ චිත්‍රපටයක් නිපදවීමේ අරමුණ ගත්තේ නම් ගැමි සමාජය නිරූපණය වන චරිත පාත්‍ර සඳහා ඊට අනුකූල පරිසරයකින් ම තෝරා ගැනීම කළ හැකි ව තිබිණි. 'නළුවා යනු පර්යේෂණ උපකරණයකි' යන රොච්ගේ අදහස මෙහි දී යළිත් ඉස්මතු වී. එහෙත් එවැනි පුද්ගලයන් තෝරාගෙන සැලසුම් සහගත ලෙස පහසුවෙන් චිත්‍රපටයක් රූපගත කිරීම් අසීරු කටයුත්තකි. එහෙත් මානව විද්‍යාත්මක කැක්කුමකින් යුක්ත චිත්‍රපටකරුවෙකු (මානවවංශලේඛ චිත්‍රපටකරුවෙකු) අතගසන්නේ ඒ බැරෑරුම් කටයුත්තට ය. එනිසා බැද්දේගම චිත්‍රපටයෙන් අපට එවැන්නක් බලාපොරොත්තු විය නොහැක. එහෙත් ශ්‍රී ලාංකේය මානවවංශලේඛ චිත්‍රපට ශානරයක් හඳුනා ගැනීමේ දී අපට මෙම චිත්‍රපටය මගහැර යා නොහැකි ය. එහි ඇති ඇතැම් නිරූපණ වැදි හා ගැමි සමාජය අතර වූ වනගත මානව කණ්ඩායමකගේ ඇදහිලි හා විශ්වාස, යාතුකර්ම පිළිබඳ ව හැදෑරීමට පාදක කරගත හැකිය. හත්වෙනි දවස, හුලවාලි වැනි චිත්‍රපට ද මෙහි දී අවධානයට ලක් විය යුතු අතර එම චිත්‍රපට ද ඉහත විචාර චෝදනාවෙන් තොර්දේ.

## නිගමන හා යෝජනා

මෙම ශාස්ත්‍රීය ලිපිය මගින් දෘශ්‍යාත්මක මානව විද්‍යාව පිළිබඳ ජගත් ප්‍රවණතා හඳුන්වා දී ඇත. තදිය විෂය ක්ෂේත්‍රය පිළිබඳ මූලික සංකල්ප හා නිර්වචන ඉදිරිපත් කරන ලද්දේ එය ශාස්ත්‍රීය ව හැදෑරීමේ වැදගත්කම පෙන්වීම සඳහා යි. සිනමාව මතු නොව බහුවිධ මාධ්‍ය පිළිබඳ ආසක්තවීමක් පෙන්නුම් කෙරෙන වර්තමානයේ දී දෘශ්‍යාත්මක මානව විද්‍යාව හැදෑරීම කාලීන අවශ්‍යතාවකි. එමෙන් ම එය මෙරට මානව විද්‍යා ක්ෂෙත්‍ර පර්යේෂණ එළි දැක්වීම සඳහා නව මාන හා මාධ්‍යය පෙන්වා දෙන්නකි. තවමත් මෙරට විශ්වවිද්‍යාලයන් මානව විද්‍යා අධ්‍යයනාංශ මගින් මෙම විෂය සඳහා ප්‍රමාණවත් අවධානයක් යොමු කර නොමැත. මානවවංශලේඛ චිත්‍රපටය නමින් ශ්‍රී ලාංකේය සිනමා ක්ෂේත්‍රයට නව ෂානරයක් (Genre) හඳුන්වා දීම සඳහා ද දෘශ්‍යාත්මක මානව විද්‍යා සංකල්ප තහවුරු කිරීම් අතිශයින් වැදගත් වේ. විශේෂයෙන් ම ඩිජිටල් තාක්ෂණයත් සමඟ වීඩියෝ උපකරණ සහ සැහැල්ලු කැමරා භාවිතය බහුල වී ඇත. එමෙන් ම පරිගණක ආශ්‍රිත සංස්කරණ මෘදුකාංග භාවිතය ද වැඩි වෙමින් පවතී. ඒ අනුව දෘශ්‍යාත්මක මානව විද්‍යා ක්ෂේත්‍රය සඳහා විසල් ප්‍රස්තරයක් මෙරට මානව විද්‍යා ක්ෂේත්‍රයේ මතුවී ඇත. මානවවංශ ලේඛනය සඳහා මෙතෙක් මෙරට බහුල ව භාවිත වී ඇත්තේ සාහිත්‍යමය ප්‍රකාරය පමණි. ඒ නවකතා ස්වරූපයෙන් මානව විද්‍යා දැනුම ඉදිරිපත් කිරීම යි. ආර්. ඇල්. ස්පිට්ල්, පියසේන කහඳගමගේ, දඹානේ ගුණවර්ධන එමග ගත් ලේඛකයෝ වෙති. ඔවුන්ගේ නවකතා සුවිශේෂී ජන කණ්ඩායම් හා කාල වකවානු නියෝජනය කරයි. දෘශ්‍යාත්මක මානව විද්‍යාවට අනුව මානවවංශ ලේඛනකරණයක් සිදු වී ඇති ශ්‍රී ලාංකේය මානවවංශලේඛ චිත්‍රපට ෂානරයක් අපට හඳුනා ගත හැකි ය. ඒ අනුව මෙරට චිත්‍රපට හා ටෙලි නාට්‍ය ක්ෂේත්‍රයේ මානවවංශලේඛ විමර්ශනයක් කිරීම සඳහා දෘශ්‍යාත්මක මානව විද්‍යා සංකල්පය භාවිත කළ හැකි ය. මානව විද්‍යා දැනුම වින්දනාත්මක ව හා ආකර්ෂණීය ව ඉගැන්වීම හා ඉදිරිපත් කිරීමට එමගින් හැකිවේ. පර්යේෂණ ක්ෂේත්‍ර සඳහා මූල්‍ය සම්පාදනයේ දී මානවවංශලේඛ චිත්‍රපටය වැනි නව මාධ්‍ය භාවිතය සඳහා සිදු කෙරෙන පර්යේෂණ උදෙසා විශේෂ අවධානයක් යොමු කළ යුතු බව යෝජනා කරනු කැමැත්තෙමි. එමෙන් ම ජාතික චිත්‍රපට සංස්ථාවේ අවධානය යටතේ ඊට සානුබල සපයන ප්‍රතිපත්ති රාමුවක් සැකසීම ද අත්‍යවශ්‍ය වේ. එය චිත්‍රපටයට පමණක් නොව මානව විද්‍යාවට ද දක්වන අනුග්‍රහයක් ම වේ.

## උපග්‍රන්ථය
## දෘශ්‍යාත්මක මානව විද්‍යා චිත්‍රපට නාමාවලිය

මෙම නාමාවලිය කාල අනුක්‍රමික ව (chronologically) සැකසී ඇත. මෙහි නියෝජනය වන්නේ ජගත් සිනමාවේ ආරම්භයේ සිට මෑත වකවානුව දක්වා මානව විද්‍යානුකූල නැඹුරුවකින් යුතු මානවවාංශලේඛ වෘත්තාන්ත හා වෘත්තාන්ත නොවන චිත්‍රපට නිපදවූ චිත්‍රපටකරුවන් හා චිත්‍රපට ය (VAF, 2009).

Alfred C. Haddon – UK

- Torres Strait Expedition, 1898

Edward S. Curtis – US

- In the Land of the Head Hunters, 1916

Robert J. Flaherty – US

- Nanook of the North, 1922
- Moana, 1026
- Man of Aran, 1934
- Tabu (htt://www.imdb.com/title/tt0022458/), 1936
- Louisiana Story (htt://www.imdb.com/title/tt0040550/), 1948

Jose Leitao Barros – Portugal

- Maria do Mar (htt://www.imdb.com/title/tt0021125/maindetails), 1930
- Ala-Arriba! (film), 1942

Jean Epsein – Poland

- L'or des mers (htt://www.imdb.com/title/tt00203759/) (The oceans gold), 1932

Jean Rouch – France

- Les Maitres (The Mad Masters), 1954
- Moi, un noir, 1958

- Chronique d'un ete (Chronicle of a Summer), 1961
- Jaguar (film), 1954 – 1967
- Petit a petit, 1972

Lionel Rogosin – US
- On the Bowery, 1957
- Come Back, Africa, 1957

John Marshall – US
- The Hunters (1957 film), 1957
- A Kalahari Family, 1952-2000

Antonio Campos – Portugal
- AAlmadraba atuneira (Tuna net), 1961
- Vilatinho das furnas, 1971
- Historias selvagens (Savage stories), 1978
- Falamos de Rio de Onor (Let's talk about Rio de Onor)
- Gente da praia da Viera (The people of praia da Vieira), 1076
- Terra fria (Cold land), 1992

Manoel de Oliveira – Portugal
- Acto da primavera (Act of Spring), 1963

Michel Brault – Canada
- Pour la suite du monde, (Of Whales, the Moon and Men), 1963

- Les Ordres (Orderers) 1975
- Les Noces de papier (Paper weddings), 1990]

Pierre Perrault – Canada

- Pour la suite du monde (Of Whales, the Moon and Men), 1963

Robert Gardner – US

- Dead Birds, 1965
- The Nuer, 1970
- Rivers of Sand, 1975
- Forest of Bliss, 1986

Tim Asch – US

- The Feast, 1969
- Yanomamo: A Multidisciplinary Study, 1971
- Magical Death, 1974
- The Ax Fight, 1975
- A Man Called "Bee": Studying the Yanomamo 1975
- A Baliness Trance Séance, 1979

Sarah Elder (http://www.der.org/films/filmmakers/sarah-elder.html) (films co-directed by Leonard Kamerling) – Australia

- Tununermiut, 1972
- At the Time of whaling (1974)
- On the Spring Ice (1975)
- From the First People (1977)
- The Drums of Winter (1988)
- Joe Sun (1988)
- Reindeer Thief (1988)

Ricardo Costa – Portugal

- Avieiros, 1975
- Mau tempo, marese mudanca (Bad weather, tides and change), 1976
- Castro Laboreiro, 1079
- Pitoes, aldeia do Barroso (Pitoes, a village of Barroso), 1979
- O paoeo Vinho (Btead and Wine (film), 1981
- Longe e a cidade (Far awaya id the city), 1981
- Ao fundo desta Estrada (Further ahead on this road) 1981

Antonio Reis and Margarida Cordeiro – Portugal

- Tras-os-Montes, 1976
- Ana (film), 1984

Noemia Delgado – Portugal

- Mascaras (Masks), 1976

John Bishop (http://www.der.org/films/filmmakers/john-bishop-html) – Australia
- YoYo Man, 1978
- New England Fiddles (1983)
- Last Window (1987)
- Himalayan Herders (1997)
- Hosay Trinidad (1999)
- Oh What A Biow That Phantom Gave Me (http://media- generation.con/Films/OWB/OWB.htm) (2003, with Harald E.L. Prins)

Jayasinhji Jhala (http://www.der.org/films/ jayasinhji jhala. html) – US
- Forgotten Headhunters and Apatani Sacrifice, 1978

- Tragada Bhavai: A Rural Theater Troupe of Gujarta, 1981
- Journey with Ganapati (1982)
- Bharvad Predicament (1987)
- Morning With Asch (1995)
- Whose Paintings? (1995)
- Conversation with a Collector:Dialogue with a Docent (1997)
- Letter to My Nieces (2000)
- Close Encounters of No Kind (2002)
- A Zenana: Scenes and Recollections (2005)
- ShaktiMa no Veh (2006)

Bob Connolly and Robin Anderson

- First Contact, 1983
- Joe Leahy,s Neighbors, 1988
- Black Harvest, 1991

Harald E.L. Prins (http://www.folkstreams.net/filmmaker,102) – Netherlands

- Our Lives in Our Hands, 1985

Dennis O'Rourke – Australia

- Cannibal Tours, 1988
- Hominid Evolution 1: The Early stages (2001)
- Hominid Evolution 2: The Early stages (2001)

Pedro Costa – Portugal

- Casa de lave (Down to Earth), 1994
- Ossos (Bones), 1990 No Quarto da Vanda (In Vanda's room) (2000)
- Juventude em Marcha (Colossal youth), 2006

Flora Gomes – Guine-Bissau

- Po di Sangui, 1996

- Nha Fala, 2002

Fernando Meirelles – Brazil

- Cidade de Deus, (City of God, 2002

Daniel E. Thorbecke – Germany

- Terra Longe, (Far distant land). 2003

Chris Horner (http://www.ber.org/films/filmmakers/chris.horner.html) – Australia

- The Disappering of Tuvalu : Trouble In Paradise, 2004

Randy Olson (http://www.ber.org/films/filmmakers/randy-olson.html)

- Flock of Dodos, 2006

- Oh, What a Blow that phantom Gave Me! (http://mediageneration.com/ Films.OWB/OWB.htm) (2003, with john Bishop)

## පරිශීලිත මූලාශ්‍රයෝ

ගම්ලත් සුචරිත (1995) සාහිත්‍ය කලා ආදිය ගැන, කොළඹ, ඇස්. ගොඩගේ ප්‍රකාශකයෝ.

පෙරේරා සසංක (2008-12-28) "මානව විද්‍යාවෙන් අපි කරන්නේ තාක්ෂණික අධ්‍යාපනයේ හිඩැස පිරවීම" කොළඹ, සිළුමිණ පුන්කළස අතිරේකය.

වෙල්ස් පෝල් (2005) "වාර්තා චිත්‍රපටයේ නව ස්වරූපය" 'චිත්‍රපටය' වෙළුම 2004 සැප්-දෙසැ. එම්.ඩී. මහින්දපාල (පරි), කොළඹ : ජාතික චිත්‍රපට සංස්ථාව.

Branouw, E. (1993) Documantary – A History of the Non-fiction film. New York : Oxford University press.

Crawford, P.I. and Turoton, D. (ed.). (1992) Film as Athnogrphy, New York : Manchster press.

Ethnofiction, (2009) Wekipedia, The free encyclopedia (http://en.wikipedia.org/wiki/ Ethnofiction, Accessed on 27th March 2009.

Ethnographic Film, (2009) Wekipedia, The free encyclopedia ( http://en.wikipedia.org/wiki/ Ethnographic, Accessed on 4th April 2009.

Fischer, M. D. and Zeitlyn, D. (2003) "Visual Anthropology in the Digital Mirror: Computer – Assisted Visual Anthropology" Univercity of Kent at Kanterbury.

Gundi, F. (2004) Visual Anthropology. California : Altamira Press.

Heider, K.G.. (1976) Ethnographic Film, Austin, University of Texas Press.

Hockings, P. (ed.). (1975) Principales of Visual Anthropology, Paris : Mounton Publishers.

List of Visual Anthropology film (VAF)(2009) Wekipedia, The free encyclopedia, http://en.wikipedia.org/wiki/ List of Visual Anthropology film, Accessed on 7th April 2009.

Ruby, J. (1996) Visual Anthropology in Encyclopedia of Cultural Anthropology New York, Henry Holt and Companies, v. 4.